# කර්මාන්ත

පසුගිය වර්ෂයේ සියයට 15 ක වර්ධනයට සාපේක්ෂව 1985 වර්ෂයේදී කාර්මික නිමැවුම සියයට 5 කින් වැඩිවිය. රාජ්‍ය අංශයේ කර්මාන්තවල නිමැවුම් වටිනාකම සියයට 6 කින් අඩුවූ අතර, පෞද්ගලික අංශයේ කර්මාන්තවල නිමැවුම් වටිනාකම සියයට 20 කින් වැඩි විය. මෙම වසරේදී කාර්මික නිෂ්පාදනයෙහි අඩු වර්ධනයට, ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවෙහි නිෂ්පාදනය පහත වැටීමත්, රාජ්‍ය අංශයේ සමහර වැදගත් කාර්මික සංස්ථාවන්හි දුර්වල ක්‍රියාකාරිත්වයත් මූලික වශයෙන් හේතු විය. පසුගිය වසරට වඩා වර්ධන වේගය අඩු වූවද 1985 වර්ෂයේ පෞද්ගලික අංශයේ කර්මාන්තවල වර්ධනය ඉහළ මට්ටමක පැවතිණි.

1985 වර්ෂයේ කාර්මික වර්ධනයෙහි පසුබෑස්මට ප්‍රධාන වශයෙන් බලපෑවේ රාජ්‍ය අංශයේ අඩු ක්‍රියාකාරිත්වයයි. රාජ්‍ය අංශයේ කාර්මික නිෂ්පාදනය කෙරෙහි දැඩි බලපෑමක් ඇති කරන ඛණිජ තෙල් නිමවුමෙහි පසු බෑම එම අංශයෙහි නිෂ්පාදනය සියයට 6 කින් පහත වැටීමට හේතු විය. ඛණිජ තෙල් කර්මාන්තයේ නිමැවුම ඉවත් කළවිට රාජ්‍ය අංශයේ කර්මාන්තවල නිෂ්පාදනය සියයට 2 කින් වැඩි වී ඇත.

''ආහාර, බීම වර්ග හා දුම්කොළ'', ''රෙදිපිළි හා ඇඟළුම් නිෂ්පාදන'' සහ ''කඩදාසි හා කඩදාසි නිෂ්පාදන'' යන අංශයන්හි ඇති වූ වර්ධනය පෞද්ගලික අංශයෙහි නිෂ්පාදනය සියයට 20 කින් ඉහළ නැංවීමට හේතු විය. 1985 වසරේදී කාර්මික අංශයේ ක්‍රියාකාරිත්වය කෙරෙහි දේශීය හා විදේශීය වශයෙන් අහිතකර බලපෑම් ඇතිවිය. රෙදිපිළි අපනයන සඳහා සලාක නියම කිරීම්, විදේශීය රටවලින් ඇතිවූ අනෙකුත් සීමාකාරී පිළිවෙත් සහ කාර්මික අපනයනයන් සඳහා වූ අඩු ඉල්ලුමද අපනයන වර්ධනය කෙරෙහි අහිතකර බලපෑමක් ඇති කරන ලදී. උතුරු සහ නැගෙනහිර පළාත්වල පවතින ජනවාර්ගික ගැටළු හේතුකොටගෙන එම පළාත්වල පිහිටා ඇති රාජ්‍ය අංශයේ සමහර කාර්මික සංස්ථාවල ක්‍රියාකාරිත්වය දුබල වීය.

ජනාධිපති තීරුබදු කොමිසමෙහි නිර්දේශ අයවැය ලේඛනයට ඇතුළත් කරන ලද අතර තීරුබදු ප්‍රතිපත්ති මගින් දේශීය වශයෙන් එකතු කළ අගය වැඩි කර්මාන්ත සහ අපනයන නිෂ්පාදන වල නියැළුණු කර්මාන්ත දිරිගැන්විණි.

**ආයෝජන**

කර්මාන්ත අංශයේ ආයෝජන 1985 වර්ෂය තුළදී තවදුරටත් අඩු විය. මහ කොළඹ ආර්ථික කොමිසම (ම.කො.ආ.කො.), විදේශ ආයෝජන උපදේශක කමිටුව (වි.ආ.උ.ක.) සහ දේශීය ආයෝජන උපදේශක කමිටු (දේ.ආ.උ.ක.) යන අංශයන්හි ආයෝජන 1983 වර්ෂයේ සිටම අඩු වීමේ උපනතියක් දක්වීය. ම.කො.ආ.කො. විසින් 1985 වර්ෂයේ ව්‍යාපෘති 13 ක් අනුමත කළ අතර, එහි අපේක්ෂිත ආයෝජනය රුපියල් දශ ලක්ෂ 286 ක් විය. වර්ෂය අවසන් වනවිට ම.කො.ආ.කො. විසින් ව්‍යාපෘති 211 ක් අනුමත කර තිබුණි. මෙයින් ව්‍යාවසාය-යන් 119 ක් විවිධ කර්මාන්ත පිහිටුවීම සඳහා කොමිසම සමග ගිවිසුම් අත්සන් කොට තිබුණි.

විදේශ ආයෝජන උපදේශක කමිටුව විසින් 1985 වර්ෂයේ අනුමත කළ කාර්මික ව්‍යාපෘති ගණන 30 කි. මෙම ව්‍යාපෘතිවල සමස්ත ආයෝජන වටිනාකම, රුපියල් දශ ලක්ෂ 220 ක විදේශීය ආයෝජන ඇතුළුව රුපියල් දශ ලක්ෂ 476 ක් විය. වර්ෂය තුළදී අනුමත කළ ව්‍යාපෘති වලින් 3 ක් පමණක් රෙදිපිළි අංශයේ විය. මෙම ව්‍යාපෘතිවලින් අපේක්ෂිත මුළු සේවා නියුක්ති ඉඩ ප්‍රස්තා සංඛ්‍යාව 2,503 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. වර්ෂය අවසන් වන විට වි.ආ.උ.ක. විසින් අනුමත කරන ලද මුළු ව්‍යාපෘති සංඛ්‍යාව 237 කි.

කර්මාන්ත හා විද්‍යා කටයුතු, පේෂකර්මාන්ත හා ධීවර යන අමාත්‍යාංශවලට සම්බන්ධ දේශීය ආයෝජන උපදේශක කමිටු මගින් 1985 වර්ෂයේ කාර්මික ව්‍යාපෘතීන් 344 ක් අනුමත කර ඇති අතර 1984 වර්ෂයේදී අනුමත කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව 474 ක් විය. මෙම ව්‍යාපෘතීන්හි අපේක්ෂිත ආයෝජනය රුපියල් දශ ලක්ෂ 321 කි. එමගින් අපේක්ෂිත රැකියා සංඛ්‍යාව ආසන්න වශයෙන් 12,850 කි.

**නිෂ්පාදනය**

1985 වර්ෂයේ සමස්ත කාර්මික නිමැවුමෙහි වටිනාකම පවත්නා මිළ අනුව සියයට 9 කින් වැඩිවූ අතර එය 1984 වර්ෂයේදී සියයට 25 ක් විය. එහෙත් ඛනිජ තෙල් නිෂ්පාදිත ඉවත් කළ පසු කාර්මික නිෂ්පාදනය සියයට 20 කින් වැඩි වී ඇතැයි ඇස්තමේන්තු කර ඇත. මෙහිලා වඩා වැදගත් වූයේ කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත සියයට 31 කින්, රෙදිපිළි හා ඇඟළුම් නිෂ්පාදිත සියයට 26 කින් සහ ආහාර, පාන වර්ග හා දුම්කොළ නිෂ්පාදිත සියයට 32 කින් වැඩිවීමයි. නිෂ්පාදන වටිනාකම අඩු වූ ප්‍රධාන අංශයන් අතර මූලික ලෝහ නිෂ්පාදිත (සියයට 38 කින්) සහ රසායනික හා ඛනිජ තෙල් නිෂ්පාදිත (සියයට 9 කින්) ප්‍රධාන තැනක් ගනී.

**1.12 සංඛ්‍යා සටහන**

**කාර්මික නිෂ්පාදන වටිනාකම 1981–1985**

රුපියල් දශ ලක්ෂ

| කාර්මික ගණය | 1981 | 1982 | 1983 | 1984 | 1985(අ) |
|---|---|---|---|---|---|
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ | 4,496 | 5,246 | 6,998 | 8,623 | 10,497 |
| 2. රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදිත . | 3,040 | 3,863 | 5,136 | 7,565 | 9,505 |
| 3. දැව හා දැව නිෂ්පාදිත (ගෘහ භාණ්ඩ ඇතුළුව) | 315 | 361 | 522 | 640 | 705 |
| 4. කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත . | 626 | 725 | 901 | 907 | 1,187 |
| 5. රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත . . | 12,015 | 13,099 | 11,888 | 14,328 | 13,104 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත (ඛනිජ තෙල් හා ගල් අඟුරු හැර) . . . . | 1,250 | 1,370 | 1,468 | 1,829 | 1,854 |
| 7. මූලික ලෝහ නිෂ්පාදිත . . . . | 428 | 262 | 302 | 199 | 123 |
| 8. සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර සූත්‍ර හා ප්‍රවාහන උපකරණ . . . . | 782 | 904 | 1,129 | 1,456 | 1,592 |
| 9. අන් තැනක සඳහන් නොවූ නිෂ්පාදිත . . | 58 | 74 | 90 | 106 | 125 |
| එකතුව | 23,010 | 25,904 | 28,434 | 35,653 | 38,692 |

(අ) තාවකාලික

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

මූර්ත වටිනාකම අනුව බලන කල 1984 වර්ෂයේ සියයට 15 ක සැළකිය යුතු වර්ධනයට සාපේක්ෂව, 1985 වර්ෂයේදී සමස්ත කාර්මික නිමැවුමෙහි සියයට 5 ක වැඩි වීමක් වූ බවට ඇස්තමේන්තු කර ඇත. මෙය පෞද්ගලික අංශයේ කර්මාන්තයන්හි සියයට 20 ක වර්ධනයේ හා රාජ්‍ය අංශයේ කර්මාන්තයන්හි සියයට 6 ක අඩුවීමේ ඒකාබද්ධ ප්‍රතිඵලයකි. රාජ්‍ය අංශයේ කාර්මික නිමැවුමේ අඩු වීමට ප්‍රධාන හේතුව ඛනිජ තෙල් හා රසායනික නිෂ්පාදිතයන්ගේ සියයට 15 ක අඩුවීමය. ඛනිජ තෙල් සංස්ථාවේ නිමැවුම ඉවත් කළහොත් රාජ්‍ය හා පෞද්ගලික අංශයන්හි සමස්ත කාර්මික නිෂ්පාදිතය සියයට 9 කින් වැඩි විය.

නිමැවුමේ වැඩිවීමක් වාර්තා කළ උප අංශයන් අතර රෙදිපිළි, ඇඟළුම් හා සම් නිෂ්පාදිත (සියයට 20), කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත (සියයට 17), ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත (සියයට 9) ප්‍රධාන තැනක් ගනී. අනෙක් අතට මූලික ලෝහ නිෂ්පාදිත සියයට 42 කින්ද, ඛනිජ තෙල් හා රසායනික නිෂ්පාදිත සියයට 10 කින් සහ ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත සියයට 3 කින්ද පහත වැටුණි.

**රාජ්‍ය අංශයේ කර්මාන්ත**

1985 වර්ෂය තුළ රාජ්‍ය අංශයේ කර්මාන්ත කටයුතුවල වෙනස්කම් කීපයක් ඇති විය. වර්ෂය තුළ රාජ්‍ය දැව සංස්ථාව මගින් උසස් වර්ගයේ දැව හිඟය සපුරාලීම් වස් ඉරන ලද පොල් ලී සහ බිත්ති පනේල නිෂ්පාදනය කිරීමේ නව ව්‍යාපා යක් ඇරඹිය. නිෂ්පාදන අඩු වැඩිවීම ඉවත් කිරීම සහ සාධාරණ මිළකට ලබාදීම සහතික කිරීම පිණිස 1985 පෙබරවාරි මාසයේදී රාජ්‍ය මුද්‍රණ සංස්ථාව විසින් අභ්‍යාස පොත් නිෂ්පාදනය ආරම්භ කරන ලදී.

**1.13 සංඛ්‍යා සටහන**

**රාජ්‍ය අංශයේ ප්‍රධාන කර්මාන්ත නිමැවුම් දර්ශකය**
**(1977=100)**

| කාර්මික ගණය | ජනවාරි—දෙසැම්බර් | | |
|---|---|---|---|
| | 1983 | 1984 | 1985(අ) |
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ ... ... | 73·6 | 52·5 | 48·5 |
| 1.1 කිරි නිෂ්පාදිත ... ... | 46·4 | 41·4 | 45·8 |
| 2. රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදිත ... ... | 127·0 | 140·9 | 185·9 |
| 2.1 රෙදිපිළි ... ... | 156·7 | 186·8 | 244·9 |
| 3. දැව හා දැව නිෂ්පාදිත ... ... | 163·0 | 149·1 | 138·4 |
| 4. කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත ... ... | 135·7 | 117·2 | 142·8 |
| 5. රසායනික නිෂ්පාදිත ... ... | 105·1 | 125·1 | 105·8 |
| 5.1 ඛනිජ තෙල් නිෂ්පාදිත ... ... | 98·0 | 119·9 | 105·8 |
| 5.2 ටයර් ... ... | 157·2 | 127·9 | 128·2 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත ... ... | 124·6 | 106·4 | 103·4 |
| 6.1 සිමෙන්ති ... ... | 130·1 | 111·0 | 105·1 |
| 7. මූලික ලෝහ නිෂ්පාදිත ... ... | 109·2 | 75·5 | 43·6 |
| 8. සකස් කළ ලෝහ නිෂ්පාදිත ... ... | 76·8 | 87·0 | 101·1 |
| සියළුම කාර්මික ගණයන් ... ... | 106·7 | 112·9 | 106·1 |

(අ) තාවකාලික


මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

රාජ්‍ය අංශයේ කාර්මික ව්‍යවසායයන්හි සමස්ත නිමැවුම මූර්ත වශයෙන් සියයට 6 කින් පහත වැටිණ. මෙම පහත වැටීම කෙරෙහි ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙහි (සියයට 12) සහ රාජ්‍ය වානේ සංස්ථාවෙහි (සියයට 42) නිෂ්පාදනය අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු විය. 1985 වසරේදී ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හැර රාජ්‍ය අංශයේ සෙසු ව්‍යවසායයන්හි නිමැවුම සියයට 2 කින් වැඩි වූ බැව් වාර්තා කෙරේ.

---

වර්ෂය තුළ රාජ්‍ය සංස්ථාවල ක්‍රියාකාරීත්වයෙහි අසමතාවයන් දක්නට ලැබිණ. ජාතික පේෂකර්ම (සියයට 34), රාජ්‍ය පතල් කැණීම් සහ ඛනිජ සංවර්ධන (සියයට 26), ජාතික කඩදාසි (සියයට 22) සහ ඛනිජ වැලි (සියයට 22) යන සංස්ථාවල ද බ්‍රිටිෂ් සිලෝන් (සියයට 38) සහ ජාතික කිරි මණ්ඩලයේ (සියයට 10) නිමැවුම්හි විශාල වැඩි වීමක් වාර්තා කළේය. පරන්තන් රසායන ද්‍රව්‍ය (සියයට 81), ලංකා වානේ (සියයට 42), රාජ්‍ය රබර් නිෂ්පාදන (සියයට 37),

## රාජ්‍ය අංශයේ කර්මාන්ත නිමැවුම් දර්ශකය




ශ්‍රී ලංකා මහ බැංකුව.

ජාතික ලුණු (සියයට 22), ලංකා තෙල් හා මේද (සියයට 14), ලංකා ඛනිජ තෙල් (සියයට 12), ලංකා තුනී ලෑලි (සියයට11), ලංකා පිහන් (සියයට 8) සහ ලංකා සිමෙන්ති (සියයට 5) සංස්ථාවල නිමැවුමෙහි අඩු වීමක් වාර්තා කළේය.

රාජ්‍ය අංශයේ සමහර සංස්ථාවල දුබල ක්‍රියාකාරිත්වයට බලපෑ කරුණු විවිධ වේ. උතුරු පළාත්හි පවත්නා ජනවාර්ගික බාධක සහ දකුණු සහ බටහිර පළාත්හි පැවැති පීඩාකාරී කාලගුණික වාතාවරණ මගින් ජාතික ලුණු සංස්ථාවේ නිෂ්පාදනයට බලපෑම් ඇතිවිය. පරන්තන් රසායන ද්‍රව්‍ය කර්මාන්ත ශාලාව ආරක්ෂක හේතූන් නිසා 1985 අප්‍රේල් මස සිට තාවකාලිකව වසා දමූ අතර, දේශීය වශයෙන් නිපැයෙන නැප්තා භාවිතයට ගනිමින් යූරියා නිෂ්පාදනය කිරීම වාණිජමය නොවන බැවින් රාජ්‍ය පොහොර නිෂ්පාදන සංස්ථාව වසා දැමීමට තීරණය කරන ලදී. නඩත්තු කිරීම සඳහා සපුගස්කන්ද තෙල් පිරිපහදුව මාස දෙකක කාලයක් තුළ වසා තැබීම හේතුකොට ගෙන ඛනිජ තෙල් සංස්ථාවේ නිෂ්පාදනය පහත වැටුණි. වානේ සංස්ථාව ද්‍රවශීලතා ගැටළු වලට මුහුණ දුන් අතර, ජනවාර්ගික බාධකවල ප්‍රතිඵලයක් වශයෙන් සිමෙන්ති නිෂ්පාදනයට අවහිරතා පැන නැගිණ.

ලබාගත හැකි සංඛ්‍යා මත 1985 වසරේදී ස්කාගාර, ටයර්, ඛනිජවැලි, පතල් කැණීම සහ ඛනිජ සංවර්ධන සහ ලෝහ භාණ්ඩ සංස්ථාවල විකුණුම්වල වැඩිවීම් පෙන්නුම් කරනු ලැබූ අතර, ජාතික කිරි මණ්ඩලය, තෙල් හා මේද, ලුණු, රෙදිපිළි, තුනී ලෑලි, පරන්තන් රසායන, පොහොර නිෂ්පාදන, පිහන්, සිමෙන්ති සහ වානේ සංස්ථාවල විකුණුම්හි පහත වැටීමක් පෙන්වීය.

1985 වසරේදී රාජ්‍ය අංශයේ සංස්ථා විශාල ගණනක ඵලදායිත්වය සම්බන්ධව සැක පහළ විය. කෙසේ වෙතත්, සමහරක් සංස්ථාවල ලාභ අලාභ සංඛ්‍යා ඒවායේ ඵලදායිත්වය දක්වෙන නිවැරදි මිණුම් දර්ශක නොවේ. නිදසුන් වශයෙන් සුළු වශයෙන් හෝ කොහෙත්ම නිෂ්පාදනය නො කෙරෙන සමහර සංස්ථාවල, වසර තුළදී ලාභ සටහන් පැවැතිය හැකිය. මෙවැනි අවස්ථාවලදී වෙළෙඳ කටයුතුවලින් සහ පවත්නා තොගය අලෙවි කිරීමෙන් ලාභ ඇති වීමට පිළිවන. පරන්තන් රසායනික සහ රාජ්‍ය පොහොර නිෂ්පාදන සංස්ථා මෙයට හොඳම නිදසුන් වේ. කෙසේ නමුත් ස්කාගාර, කඩදාසි සහ පොහොර, ලංකා ඔක්සිජන් සහ ලංකා පෝසිලේන් යන ව්‍යවසායයන්හි මූල්‍යමය ඵලදායිත්වය හේතුවෙන් ඉකුත් වසරට වඩා ලාභවල වර්ධනයක් පෙන්නුම් කළේය. රටේ සමහර ප්‍රදේශවල පැවති ආරක්ෂාව පිළිබඳ තත්ත්වය, අමු ද්‍රව්‍ය හිඟකම, පුහුණු සේවකයන් මදිකම සහ ද්‍රවශීලතා ගැටළු යන කරුණු සංස්ථා ගණනාවකම අසතුටුදායක ක්‍රියාකාරීත්වයට හේතු විය.

1985 වසර තුළ රාජ්‍ය අංශයේ කාර්මික ව්‍යවසායයන්ට කෙරුණු රජයේ සංක්‍රාම ගෙවීම් රුපියල් දශ ලක්ෂ 420 ක් විය. මෙහි, ප්‍රාග්ධන සංක්‍රාම රුපියල් දශ ලක්ෂ 368 ක් හෙවත් සියයට 88 කින් සහ ජංගම සංක්‍රාම රුපියල් දශ ලක්ෂ 52 ක් හෙවත් සියයට 12 කින් සමන්විත විය. රාජ්‍ය අංශයේ කර්මාන්තවලට සිදු වූ රජයේ සංක්‍රාමවලින් රුපියල් දශ ලක්ෂ 316 හෙවත් සියයට 75 ක් සීනි සංයුක්ත මණ්ඩලයට ලැබිණ. ජාතික රෙදිපිළි, ජාතික කඩදාසි සහ ජාතික කිරි මණ්ඩලය සංක්‍රාමයන් ලැබූ අනෙකුත් ප්‍රධාන ව්‍යවසායයන්ය. මෙම සංස්ථාවල නිෂ්පාදිත හැකියාව වැඩි කිරීම සඳහා උනන්දු කරවීමට සහ රාජ්‍ය අයවැයට ඇතිවන බර අඩු කරලීම් වස් 1985 වර්ෂයේදී රාජ්‍ය අංශයේ සංස්ථාවලට කෙරුණු සංක්‍රාමයන් සෑහෙන පමණ පහත වැටීම සැළකිල්ලට ගත යුතුය.

**1.14 සංඛ්‍යා සටහන**

**කාර්මික ව්‍යවසායයන්ට කෙරෙන රාජ්‍ය අරමුදල් සංක්‍රාම 1983 – 1985**

රුපියල් දශ ලක්ෂ

| සංස්ථාව/ව්‍යවසායය | ප්‍රාග්ධන | | | වර්තන | | | එකතුව | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 1983 | 1984 | 1985(අ) | 1983 | 1984 | 1985(අ) | 1983 | 1984 | 1985(අ) |
| 1. ජාතික කිරි මණ්ඩලය | 9·0 | 7·5 | — | 21·3 | 25·1 | 25·0 | 30·3 | 32·6 | 25·0 |
| 2. ලංකා තෙල් හා මේද | 25·3 | 99·1 | 6·0 | — | — | — | 25·3 | 99·1 | 6·0 |
| 3. ශ්‍රී ලංකා සීනි | 122·5 | 168·8 | 316·0 | — | 7·1 | — | 122·5 | 175·9 | 316·0 |
| 4. ජාතික පේෂකර්ම | 31·5 | 127·2 | 42·0 | 32·7 | — | — | 64·2 | 127·2 | 42·0 |
| 5. ජාතික කඩදාසි | — | 5·6 | — | — | — | 27·1 | — | 5·6 | 27·1 |
| 6. රාජ්‍ය පොහොර නිපදවීමේ | — | — | — | 694·7 | 537·3 | — | 494·7 | 537·3 | — |
| 7. ලංකා වානේ | 39·1 | — | — | — | — | — | 39·1 | — | — |
| 8. ජාතික ඇඟුරුම් ද්‍රව්‍ය | — | — | — | 7·7 | 1·0 | — | 7·7 | 1·0 | — |
| 9. රාජ්‍ය මුද්‍රණ | — | 51·6 | 3·7 | — | — | — | — | 51·6 | 3·7 |
| 10. ලංකා ඔක්සිජන් සමාගම | — | — | — | 8·7 | 6·1 | — | 8·7 | 6·1 | — |
| එකතුව | 227·4 | 459·8 | 367·7 | 565·1 | 576·6 | 52·1 | 792·5 | 1,036·4 | 419·8 |

(අ) අනුමත කළ

මූලය: මහා භාණ්ඩාගාරය.

## බලශක්ති සහ ඉන්ධන

ඉකුත් වසර හා සසඳන විට කර්මාන්තයනට අලෙවි කරනු ලැබූ කාර්මික ඉන්ධන ප්‍රමාණය 1985 වර්ෂයේදී සියයට 44 කින් පහත වැටුණි. මෙම පහත වැටීම 1985 වසරේදී ලංකා විදුලි බල මණ්ඩලය සිය තාප බල උත්පාදනය විශාල ලෙස අඩු කිරීම නිසා බැර ඩීසල් සහ උදුන් තෙල් පරිභෝජනය අඩු කිරීමේ ප්‍රතිඵලයකි.

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළදී, කර්මාන්තයන්හි විදුලි බල භාවිතය, පසුගිය වර්ෂය හා සැසඳීමේදී, සියයට 7 කින් වැඩිවිය. මෙම වැඩිවීම සැකසුනේ, කුඩා කර්මාන්ත, මධ්‍යම කර්මාන්ත හා විශාල කර්මාන්තයන්හි පිළිවෙලින් වූ සියයට 11, සියයට 10 සහ සියයට 4 යන වැඩිවීම් වලිනි.

**1.15 සංඛ්‍යා සටහන**

**කර්මාන්තයන්හි බලය හා ඉන්ධන භාවිතය 1983 – 1985**

| ශීර්ෂය | 1983 | 1984 | 1985(අ) |
|---|---|---|---|
| 1. විදුලිය බලය (ආ) (ගිග වොට් පැය) ... ... | 752·0 | 788·3 | 846·0 |
| 1.1 කුඩා කර්මාන්ත ... ... ... | 29·0 | 31·5 | 35·1 |
| 1.2 මධ්‍යම කර්මාන්ත ... ... ... | 339·7 | 370·5 | 409·7 |
| 1.3 විශාල කර්මාන්ත ... ... ... | 383·3 | 386·3 | 401·2 |
| 2. කාර්මික ඉන්ධනවල දේශීය අලෙවිය (මෙට්‍රික් ටොන් දහස්) ... ... | 538·6 | 293·5 | 163·8 |
| 2.1 බැර ඩීසල් ... ... ... | 285·5 | 78·6 | 23·5 |
| 2.2 දව් තෙල් ... ... ... | 253·1 | 214·9 | 140·3 |

මූලයයන් : ලංකා විදුලිබල මණ්ඩලය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව.

(අ) තාවකාලික.

(ආ) නිෂ්පාදන සහ අපනයන සැකසුම් කර්මාන්තද ඇතුළත්ය. කිලෝ වෝල්ට් ඇම්පියර් 50 ට අඩු ධාරිතාවයක් ඇති ඒවා කුඩා කර්මාන්ත වශයෙන්ද, කිලෝ වෝල්ට් ඇම්පියර් 50—500 අතර ධාරිතාවයක් ඇති ඒවා මධ්‍යම කර්මාන්ත වශයෙන්ද, කිලෝ වොල්ට් ඇම්පියර් 500 ට වැඩි ධාරිතාවයක් ඇති ඒවා විශාල කර්මාන්ත වශයෙන්ද නිර්වචනය කෙරේ.

**ආයෝජන ප්‍රවර්ධන කලාපය**

1985 වර්ෂය අවසාන වනවිට අනුමත කළ ව්‍යාපෘතීන් සංඛ්‍යාව 211 දක්වා ගෙනෙමින්, මහ කොළඹ ආර්ථික කොමිසම 1985 වර්ෂය තුළදී ව්‍යාපෘතීන් 13 ක් අනුමත කළේය. මේවායින් 119 ක්, ම. කො. ආ. කො. සමග දනටම ගිවිසුම්වලට අත්සන් තබා ඇත. ව්‍යවසායයන් 61 ක් කටුනායක ආයොජන ප්‍රවර්ධන කලාපය තුළද, 16 ක් ඉන් පිටතද, වාණිජමය නිෂ්පාදන කටයුතුවල නියැලී සිටියහ. වාණිජමය නිෂ්පාදනයේ යෙදුණු ව්‍යාපෘතීන් අතුරින් 38 ක් සකස් කළ ඇඳුම් පැළඳුම් නිෂ්පාදනයේ නියැලුණු ඒවා විය. 1984 දෙසැම්බර් මාසය වනවිට සිටි 29,477 සමග සසඳා බැලීමේදී, 1985 දෙසැම්බර්වලදී පුද්ගලයින් 32,329 ක්, ම. කො. ආ. කො. ව්‍යවසායයන්හි සේවා නියුක්තව සිටියහ.

රෙදිපිළි සහ නිමැවුම් කර්මාන්තයන්හි 5 බැගින්ද, ආහාර, රසායනික ද්‍රව්‍ය සහ සේවා අංශයන්හි 1 බැගින්ද වශයෙන්, 1985 වර්ෂයේ අනුමත කෙරුණු ව්‍යාපෘතීන් 13 බෙදී යයි.

ම.කො.ආ.කො. ව්‍යවසායයන්හි 1985 වර්ෂයේ දළ අපනයන ඉපැයුම් රුපියල් දශ ලක්ෂ 3,802 ක් (විගැහි දශ ලක්ෂ 138) වූ අතර, මෙය පසුගිය වසරට වඩා සියයට 7 ක වර්ධනයක් විය. ඇඟළුම් අපනයනයන් පසුගිය වසරට වඩා සියයට 6 කින් වැඩිවූ අතර, එය වැඩිම කොටසකට (සියයට 80) වගකියන අපනයන ඉපැයුම් අංශය ලෙස තවදුරටත් පැවතියේය. පසුගිය වසර සමග සැසඳීමේදී එම වසරේදී ඒක සේවක අපනයන ඉපැයුම රුපියල් 115,375 ක් වූ අතර, 1985 වර්ෂයේදී එය රුපියල් 115,011 ක් විය.

**1.16 සංඛ්‍යා සටහන**

**ආයෝජන ප්‍රවර්ධන කලාපය – සේවා නියුක්තිය සහ අපනයන ඉපැයුම් 1984 – 1985**

| කාර්මික ගණය | 1984 | | 1985 (අ) | |
|---|---|---|---|---|
| | සේවා නියුක්තිය (දෙසැම්බර් අවසානයට ගණන) | දළ අපනයන ඉපැයුම් (නැ.වි.ස.) රු.ද.ල. | සේවා නියුක්තිය (දෙසැම්බර් අවසානයට ගණන) | දළ අපනයන ඉපැයුම් (නැ.වි.ස.) රු.ද.ල. |
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ ... | 30 | 116·0 | — | 6·5 |
| 2. රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදිත ... | 25,041 | 2,889·1 | 26,541 | 3,052·5 |
| 3. දැව හා දැව නිෂ්පාදිත ... ... | — | 0·1 | — | — |
| 4. කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත ... | — | — | — | — |
| 5. රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත ... | 1,652 | 136·3 | 1,399 | 164·8 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත ... | 226 | 2·7 | 1,267 | 122·4 |
| 7. මූලික ලෝහ නිෂ්පාදිත ... ... | — | — | — | — |
| 8. සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ ... ... | 234 | 85·8 | 135 | 50·3 |
| 9. අන් තැනක සඳහන් නොවූ නිෂ්පාදිත ... | 1,934 | 108·0 | 2,493 | 211·2 |
| 10. සේවා (ආ) ... ... | 360 | 199·4 | 494 | 193·9 |
| එකතුව ... ... | 29,477 | 3,537·4 | 32,329 | 3,801·6 |

(අ) තාවකාලික.
(ආ) "එයාර් ලංකා සමාගම" හැර

මූලය : මහ කොළඹ ආර්ථික කොමිසම.

බියගම දෙවැනි ආයෝජන ප්‍රවර්ධන කලාපයෙහි අත්‍යවශ්‍ය පසුතල පහසුකම් වැඩි දියුණු කිරීම නිමවා ඇත. ආයෝජකයින් සය දෙනෙක් සිය කම්හල් සඳහා බියගමින් බිම් වෙන්කරවා ගෙන, එම කම්හල් ගොඩනැංවීමේ කටයුතුද 1985 වර්ෂය මුලදී ආරම්භ කරන ලදී. වර්ෂය අවසාන වනවිට, මේවායින් එක් ව්‍යාපෘතියක් වාණිජමය නිෂ්පාදනය අරඹා තිබුණු අතර, තවත් ව්‍යාපෘතියක් එහි කම්හලේ ගොඩනැගීම් කටයුතු අවසාන කර තිබුණි.

UNIVERSITY OF MORATUWA LIBRARY